ආකෘති පත්‍ර : (අංක 01)
පාර්ලිමේන්තු සැසි අංකය : 290
ආයතනයේ නම : අමාත්‍ය මණ්ඩල කාර්යාලය

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගන්නා ලද දුර්වලතාවය	දුර්වලතාවය මහහරවා ගැනීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය/වර්තමාන තත්ත්වය
භාණ්ඩ සමීක්ෂණය අවසන් කර නියමිත දිනට එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම.	2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා 2021-11-25 දින නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කරන ලදී. 2021-12-31 දින දක්වා ජනරජ ගොඩනැගිල්ලේ ස්ථාපිතව පැවති අමාත්‍ය මණ්ඩල කාර්යාලය 2022.01.03 දින සිට ලොයිඩ්ස් ගොඩනැගිල්ල වෙත ගෙන යන ලදී. එහිදී කාර්යාල කටයුතු සහ එක් එක් අංශ නැවත ස්ථාපනය කිරීමේදී ශාඛා ඉන්වෙන්ටරි නැවත යාවත්කාලීන කිරීමට සිදු විය. ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට ප්‍රමාද වූ අතර 2022.10.27 දින වන විට අපහරණ කටයුතුද අවසන් කර අදාල වාර්තාවන් විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	මේ වන විට කාර්යාලයීය සියලු වාහනවල ඉදිරිපස පැහැදිලිව පෙනෙන අයුරින් රාජ්‍ය ලාංඡනය සමඟ ආයතනයේ නම භාෂාත්‍රයෙන්ම ප්‍රදර්ශනය කර ඇත. (රා.ප.ව. 26/92 අනුව සියලුම වාහනවල පින්තාරු කිරීම අවශ්‍ය නොවේ.)
බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ නිරවුල් නොකිරීම.	වලංගු කාලසීමාව දීර්ඝ කර තිබියදීත් අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පීඑල්සී ආයතනය විසින් චෙක්පත බැංකුවට ඉදිරිපත් නොකිරීම නිසා 2021.12.31 දිනට චෙක්පත අවලංගු නොකරන ලදී. පසුව චෙක්පත අවලංගු කර පොදු තැන්පතු ගිණුමට බැර කරන ලද අතර 2022.03.21 දින අදාල ආයතනය විසින් චෙක්පත රැගෙන ගොස් බැංකු ගතකර ඇත.
අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර නොතිබීම සහ විගණන හා කළමනාකරණ කමිටු රැසවීම් වාර පවත්වා නොතිබීම.	අමාත්‍ය මණ්ඩල කාර්යාලය 2021-12-31 දින දක්වා ස්ථාපිතව තිබූ ජනරජ ගොඩනැගිල්ලේ පැවතියේ ඉතා සීමිත ඉඩ ප්‍රමාණයක් පමණි. එබැවින්, අභ්‍යන්තර විගණන නිලධාරියකු අනුයුක්ත කර ගැනීමෙන් අනතුරුව එම නිලධාරියාට ප්‍රමාණවත් කාර්යාලයීය ඉඩ පහසුකම් සැපයීම මෙන්ම විගණන කාර්ය මණ්ඩලයට අවශ්‍ය ඉඩ පහසුකම් සැපයීමද ගැටලු සහගතව පැවතුණි. මේ වන විට අමාත්‍ය මණ්ඩල කාර්යාලය කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි 'ලොයිඩ්ස්' ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති අතර, පුරප්පාඩුව සම්පූර්ණ කර නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැසවීම් පැවැත්වීමට පියවර ගෙන ඇත.

ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට සඳහා අවස්ථාවක් සලසා නොතිබීම.	දැනට ක්‍රියාත්මක ආයතනික වෙබ් අඩවියේ මුල් පිටුවේ මහජනයාට සිය අදහස් දැක්වීම සඳහා අවස්ථාව සලසා දී ඇත. පෙර පැවැති තත්ත්වයට වඩා විධිමත් හා ආරක්ෂාකාරී ක්‍රමවේදයක් අනුව සිය පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට මහජනයාට අවස්ථාව සලසා දී ඇති අතර ඒ සම්බන්ධයෙන් නිරන්තර පසුවිපරම් සිදුකරයි.

මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ දී ද කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2020 අනුව රාජ්‍ය නිලධාරීන් කාර්යාලය වෙත කැඳවීම සීමාකරන ලද අතර අත්‍යවශ්‍ය රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් සීමිත නිලධාරීන් පිරිසක් පමණක් කාර්යාලයට කැඳවන ලදී. ඒ හේතුවෙන් සමස්ත කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොතිබුණි. මේ වන විට කාර්යාලයේ පුහුණුව ලැබිය යුතු සියලුම නිලධාරීන්ට අවම පැය 12ක වාර්ෂික පුහුණු අවස්ථාවන් සහතික වන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇති අතර පසුගිය වසර වල දී පුහුණුව ලැබූ නිලධාරීන් සමස්ත කාර්ය මණ්ඩලයෙන් 50% සීමාව ඉක්මවයි.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොතිබීම.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ප්‍රකාරව මේ වන විට ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය ඇතුළත් වන පරිදි කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට කටයුතු කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018හි 6.5 ඡේදයෙහි දන්වා ඇති පරිදි ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඒ බැව් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කර ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභාකර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබීම.	අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරය සැලකීමේදී, තිරසර සංවර්ධන අරමුණු මෙම කාර්යාලයේ කාර්යයන් හා සෘජුවම සම්බන්ධ කළ නොහැක. රජයේ කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා වන සියලුම ප්‍රතිපත්තිමය තීරණයන් ලබා ගැනීමට අවශ්‍ය වන සහාය දැක්වීම මෙම කාර්යාලය මඟින් සිදු කරන බැවින්, විවිධ අමාත්‍යාංශ විසින් ප්‍රතිපත්තිමය අනුමැතියන් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී, ඒවායේ අන්තර්ගතය තිරසර සංවර්ධන

	අරමුණු හා එකඟ ද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම ඒ සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී පැහැදිලි කිරීම් ලබා දීමත් සිදුකෙරේ.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබීම.	මෙම කාර්යාලය සාමාන්‍ය වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක නොවන කාර්යාලයකි. එසේම, මෙම කාර්යාලයේ රාජකාරි ස්වභාවය අනුව සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව සහ සති අන්ත හා නිවාඩු දින වලදී ද රාජකාරි කළ හැකි නිලධාරීන් විශේෂයෙන් හඳුනාගෙන එම අයගේ ආරක්ෂක නිෂ්කාෂණ වාර්තා ද සමාලෝචන කිරීමෙන් අනතුරුව මෙම කාර්යාලය වෙත ස්ථානමාරු කරවා ගැනීමට කටයුතු කරනු ලබයි. එවැනි නිලධාරීන් හඳුනාගැනීම තරමක් දුෂ්කර කාර්යයක් වන අතර එසේ හඳුනාගත් නිලධාරීන්ගේ දීර්ඝ කාලයක් මෙම කාර්යාලයේ සේවය කිරීමට කටයුතු කර ඇත. එබැවින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ රාජකාරි සම්බන්ධයෙන් අත්දැකීම් සහිත කාර්යක්ෂම නිලධාරීන් නිරන්තරයෙන් ස්ථානමාරු සිදුකරවීම මෙම කාර්යාලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් අහිතකර බලපෑමක් ඇති කරනු ඇත. එහෙත් නිලධාරි ඉල්ලීම් හා වෙනත් මානුෂීය කාරණා මත අවශ්‍ය නිලධාරීන්ට ස්ථානමාරු ලබා දීමට අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
2024.01. 23

ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේඛම්
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ලොයිඩිස් ගොඩනැගිල්ල
ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත
කොළඹ 01.